**ආගන්තුකයා, මේ බලන්න!**

සිනමා, ඡායාරූප, සහ බහු-මාධ්‍ය සඳහා අයදුම් කැඳවීමයි

අවධාන කලාපය: දකුණු ආසියාව

**පිළිබඳව**

ජර්මනියේ නව පෙරළි පැදූ *ෆිල්ම් ඇන්ඩ් ෆොටෝ* හි 90 වැනි සංවත්සරය සහ *බැෆහවුස්* පාසැලේ 100 වන වසර සනිටුහන් කරමින්, මෙවර මාතෘකා තේමාව ඩබ්. එච්. ඕඩෙන් ඉංග්‍රීසි කවියාගේ "ආගන්තුකයා, මේ බලන්න!" කවි පෙළ අනුව යොදා ඇත.

මේ ප්‍රදර්ශනය, තනි පුද්ගලයාගෙන් ප්‍රජාවට වන දායකත්වය ගවේශනයට අන්තර්-ශික්ෂණ අවස්ථාවකි. එමෙන් ම වාර්තාපට හරහා හෝ/සහ පර්යේශනාත්මක ආකාර තුළින් අනෙක් අයට/ ආගන්තුකයන්ට ඇති සම්බන්ධය ප්‍රශ්න කිරීමට අවස්ථාවකි. ආරාධිත අයදුම්කරුවන් සියලු වයස් වල සහ බහුවිධ පසුබිම්වල අය වන්නේ එම කාරණා නිසා ය. මෙහි දී නිශ්චිතව ම ආරාධනා කරන්නේ දකුණු ආසියාතික කලා භාවිතකරුවන්ට ය. එමෙන් ම මෙහි දී කලාපය තුළ හෝ කලාපය පිළිබඳ ව නිමැවූ කෘති ඉල්ලා සිටී. ස්ථානයකට, පුද්ගලයෙකුට, අපේ ම පවුලට හෝ සිදුවීමකට ඇති අපේ බැඳීම පිළිබඳ ව සහ කෙනෙකුගේ සබැඳි බව හෝ වෙන් වුනු බව පිළිබඳ ව දැනුවත් භාවය නැංවීමට අයදුම් කරන්නන් ව මෙහි දී දිරිමත් කර සිටී.

අන් අය පිළිබඳ අපේ ම සංජානන (එනම් අප අන් අය දකින ආකාරය), එම සංජානන අපේ ලෝකය පිළිබඳ දැනුවත් බව පුළුල් කරන ආකාරය සහ ස්වයං සිද්ධ අන්තර් ක්‍රියා, අප ව නවාා, ස්ථිර ව ස්ථාපිත නො වූ සහ බලාපොරොත්තු වූ ආකාර වලින් සංනිවේදනයට පෙළඹවීම ආදිය පිළිබඳ බහු විද කියැවීම් වලට, ඕඩෙන් ගේ මාතෘකා පාඨයෙන් කුළුගැන්වුනු මෙම ව්‍යාපෘතිය ආරාධනා කර සිටී.

තෝරා ගැනුණ හොත්, ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් මාසයේ දී, ඉන්දියාවේ ගෝවේ හි පැවැත්වෙන සෙරෙන්ඩිපිටි කලා මේලාවෙහි ඇතුළත් වනු ඇත.

අයදුම් බාරගන්නා අවසාන දිනය: මැයි 31